කෙටි කතාව

ගිනි බණ්ඩාර සඳ එළියෙ හි සරණපාල කුමාරයා

ගණ්ඩරත්න වීරකෝන්

අපි දැක් තදින් අල්ලාගෙන දුවන්නට වීමු. "හොරෝ... හොරෝ.. හොරේ අනේ හොරේ" ඇගේ හැලහැවුන් අපිට බැන බැන යනවා. මිනු දුවන ගමන්ම ආපහු හැරී මුවුනට අතින් පයින් ප්‍රතිචාර දක්වුවා. අපි ඔහේ දුවනවා, සපත්තු හබ, හෝහෝල්, වෙළෙන්දන්ගේ කැකෝ ගැමි, කොයිතරම් මිනිස්සු කඩිමුඩියේ ඒ මේ අත දුවනවද? මිනිස්සු අතරේ ඇඹරී තෙරපෙන එක කොයිතරම් කෘස්ඛිමත්ද? (අනේ අපිට නම් එහෙම නමයි)

මිනු නැවතුනා. හරියටම 'කාර්ගීල්ස්' සාප්පුව ගාව. වීදුරු පෙට්ටියක බහාලූ ලස්සන ගවොමකින් සැරසුණ නෝන බෝනික්කෙක්. මන්ත මිනු දිහාවෙ ආඩම්බරයෙන් බලාගෙන ඉන්නවා (හරියට උඹට නැහැ. අපිට තියෙනව වගේ) මිනුගෙඇස් දෙක තෘෂ්ණාවෙන් පිරිලා. කට මඳක් ඇරිලා.

මතක ඇති කාලෙක ගවොමක් තියා, යට ඇඳුමක්වත් අරන් දන්නයැ. මං මොන මගුලකට මුන් මේවා පුදර්ශනය කරනවද මන්ද? මම මිනුට නොපෙනෙන්න නෝන බෝනික්කට අතින් පයින් බැන්නා. ලඝන පඩියටවත් බලලු. බොහොම අමාරුයෙන් ඉවතට ඇද්දු මිනුගෙ කකුල් දෙක, අකමැත්තෙන් මගෙ පිටිපස්සෙන් ආවා.

'චැකම්' වීදියේ පල්ලෙහාම කෙළවරේ ඔරලෝසු කනුව, පැය කවුව විනාඩි කට්ට පරද්දන වේගයෙන් කැරකෙනවා. හරියට කවුකුරුන්ගේ රේස් එක වගෙ. ඔරලෝසු කනුව යට එකෙක්, උඩ ඇගටත්තු සුද්දියො දෙන්නෙකුට සාත්තර කියනව. ඒක නම් හරිම අපූරු සාත්තරයක් වෙයි. ෂා... පියයුරු නම් කුඩායි... ලස්සනයි. මිනු මගෙ බෙල්ල අනික් පැත්තට කැරකෙව්වා.

"මූ සයින්... මූ සයින්" පාසල් වයසේ කොල්ලෙක් සපත්තු පොලිෂ් කරනවා. මං සපත්තු කකුලක් ලී පෙට්ටිය උඩින් තියා, දෑත් ඉනේ ගසාගෙන වට පිට බැලුව. හදිස්සියෙ දන්නා කෙනෙක්වත් අහලකින් ගියොත් කාටද ආඩම්බර.

මිනු සපත්තු කොල්ලගෙ මලුව අතගැවා. රූපෙලාගේ ඔඟුල් ගෙදර යන්න 'අස්කාන්න මල් බරියෙන්' (මල් වත්ත පාරෙ පරණ සපත්තු කඩවල්වලට අපේ නමක්) ගත්තු සපත්තු කුටිටමේ දන්නම් 'පොලිෂ්' අල්ලන්නෙත් නෑ වගේ. මේ කීවෙනි අඩියද? ඒකත් ගෙවිලා. යට පතුල් එළියට පැනලා නැතිනි කැන. ඒ තරමටම අවලන්. හරියට පරණ 'එවලට්' කාර් එකක් වගේ. එළියට පැනපු යටිපතුල් තාර පාරෙ ගෑවෙන විට, පාරෙ රස්නෙට දෙවියොය සිහිවෙනවා. මං උඩ පැන පැන යන්නෙ හරියට උඩරට නැටුවෙක් වගෙ.

අපි නැවතුනෙ 'ලයිට් හවුස්' එකේ. උඩම පඩි පෙළේ පස්ස කියා ගන්න තරම් වාසනා වන්තයෝ වීමු අපි. මම සප්ත මහා සාගරය සිසාරා දෙනෙත් හැරවීමි.

"සරණ..."

"හ්මි..."

"සරණ..."

"ඇයි යකෝ..."

"අපි සෙල්ලමක් කරමුද?"

"මොකක්..."

"අපි දවල්ට බඩගින්නෙ ඉමිමු"

"අපෝ ඒක පරණ ක්‍රීඩාවනෙ..."

මම මිනුගෙ දෑස් වැහැව්වා.

"කුවුද..?"

"වෙකෝවි..."

"නැහැ..."

"එහෙනං කෝල්ස්නෝයි..."

"අපෝ නැහැ..."

"දොස්තොවොස්කි වෙන්නැති"

"පිස්සුද ඔයි"

"ඔන්න එහෙමනං... මං කියන්නද?"

"හා"

"ඔයා මගේ ගිනි බණ්ඩාර සඳ එළියෙන් ආපු ආදරණීය සරණපාල කුමාරයා"

(ඇය එසේ කියන්නෙ හොඳහැටි සඳ පායා ඇති රාත්‍රියක පේරාදෙණියේ වලේ මනමේ බලද්දී මා ඇයට හමු වූ බැවිනි)

"ඇන්න අනන එකෙක් අපි දිහා බලගෙන එළිබහිනවා"

බලන එවුන් හොඳට බලා ගත්තාවෙ. මං මිනුව තරයේ සිපගත්තා. මං මේ ලෝකෙ වඩාත්ම ආශා කරන ගැහැනිය. හැමදාම අලුත් වෙන මගේ බිරිඳ මිනුමනී. අද අපි විවාහ වෙලා හරියටම සිව් වසරක් පිරුණු දවස, මේක සමරන්න අපි හිතාගත්තෙ මීට බොහෝ කල් සිට. පුතාව අල්ලපු ගෙදර රේවතී අක්කාට බලා ගන්න කියලා, හොම්ගියම උදේ පාන්දරම පැන ගත්තා. බිත්ති හතරට හිරවෙලා මිනුටත් හොඳරෝම ඇති වෙලා. කුකුළා අතින් අරගෙන මෙත් කන්තෝරු යනවා. බස් එකේ තෙරෙලා. හිරවෙලා. ඇඹරිලා. දන් ඒකට පුරුදුවෙලා එහෙම නොගිය දාට නිකං හරියට ඇඟට හරි නෑ වගෙ. කන්තෝරුවල, ඉස්පිරිතාලවල වගෙ, වෙලාව යන්නෙ හරි හෙමින්. හවසට මොකක් හරි, ග්‍රහයෙක්ම 'මෝර' කරගෙන එක්කො පැය අපේ මිතුයෙක් ඇවිදා ගාවෙ 'බාර්' එකේ මේසයට සීමා වුණු මිතුයෙක් එක්ක හෝ 'ඩියුරෝ' බාර් එකේ දුම් කාමරයේ ලගිනව.

කටට වත්කරන පළවෙනි අරක්කු කඳුල් සිට දේශපාලනේ හරි මොකක් හරි නිතීත්ත්, මුල් කරගෙන මන්ත වචන තව මරන්න පටන් ගන්නවා. බාර් එකේ සිගරට් දුම්ටයි, බේබද්දන්ගේ කැකෝ ගැසීම්වලටයි තවත් හොඳ පදමට මත් වෙනවා 'ඇල්කෝල්' උගුරෙන් පල්ලොහාට විත් ගඩෙ තියෙන කන් අපි හොඳ සත්‍යවාදියෙය. ඊට පස්සෙ කම්මුල් දෙක රිදෙනකන් මුණවල් ඉඹගෙන, පසුවෙනිදාට හමුවන තුරු හඬා දොඩා සමුගන්නවා. ඊට පස්සේ දෙපොරක් වූ කරල හයියෙන් පාරවල් දෙක තුනක් ඇනලා මිනුව නැගිටිටෙව්ලා කන දෙයක් කාල කරා දෙයක් කරල නිදිය ගන්නවා. පහුවෙනිදාටත් කතන්දරේ ඕක තමයි.

"සරණපාල කුමාරයා මට හරියට බඩගිනියි" මිනු බක බක ගා හිනා වුණා. බෝගහ යට 'සයිවර්' කඩේ 'සම්බාරු' හොද්ද හරි රසයිලු. ගුඩු ගුඩු ගාල වුණත් බොන්න පුළුවන්. (ඉස්සරහ මේසයෙ එවුන් වට පිට බලනකල් ඉඳල) "එපෝ... තවත් එපෝ" කියලා බෙහෙත් දුන්නත්, 'වෙටරය' තෝස උඩට 'සාම්බාරු' බාල්දියක් හැලුවා. කිසිම ආකාරයේ ලෝබකමක් නැතුවා වගේ. වට්ටක්කා කැලි, පරිප්පු ඇට ඒ මේ අත පාවෙන්න පටන් ගත්තා. හරියට නැව බෝට්ටු වගෙ. ඒ දේවිවට මැසි 'හෙලිකොප්ටර්' සේනා නැව බෝට්ටු වටකරගෙන තෝස ආකුමණය කරන්න සැරසෙනවා. අපි මැසි 'හෙලිකොප්ටර්' පන්න පන්නා තෝස ගිල දමමා. මිනු කැව කැවිල්ලක්. මං බයත් වුණා. නරක වෙලාවට ඇඟිල්ලක්වත් හැපෙයි කියල. අනේ පව්! මිනුමනී ඊරියෙක් වගේ කටට දෙකට ගිලදානවා. හොඳ වෙලාවට බිල ඒ තරම් ගානක් වුණේ නැහැ.

මං පුටු ඇන්දේ හේත්තුවෙලා උඩ බලාගෙන දුම් ගුටි පිට කෙරුවා. ඔකුප දුල්ලින් ආවරණය වුණු විදුලි පංකාව බැරි බැරි ගානෙ බෙරිහන් දීගෙන කැරකෙනවා. මගේ දුම බෝල, පංකාවෙන් නික්මෙන මඳ සුළඟ විසින් ගිලගන්නවා. "ජැක්පොට් පෙට්ටිය හරි ලස්සනයි" මිනු මිමිනුවා. මම කිසිම වග විභාගයකින් තොරව අත් තිබුණු සියලු මුදල්වලින් 'ජැක්පොට්' කාසි මිලදී ගත්තා. කොළ පාට, කහපාට, නිල් පාට බෝල්ල-බෝල. මිනුගෙ හිකි-හිකිය. නැවතත් මිනුගේ හිකි-හිකිය. රතු පාට මල් මල්. හරියට මිනුමණිලාගේ සරණපාලලාගේ ලෝක වගේ. මිනු කුටු කුටු ගැව. "හනේ තුන වැටුනොත් නියමයිනේ. අපි මස්කට් කමු. අනේ, පුතාට කැල්ලක් ගෙනියමු" මොන, මොන හනේ තුනක්? හනේ හත නමයි. නලලෙ රතු මොට්ටුවක් තියෙන කළු තට්ට මුදලාලි කටේ පැත්තකින් හිනා වුණා. අපි ඔහුට විරිත්තා,



පස්ස හරහා නවා පෙන්වා, එතැනින් විගැහින් මාරුවුණා.

මහ බැංකුව ඉදිරිපිට සෙනග පිරිලා. ගාලගෝටියක් වගේ. වැඩ වර්ජනයක්. ටික ටික ලංවෙන කොටයි තේරුණේ. බෝඩ් උලි උස්සගෙන ආණ්ඩු විරෝධී සටන් පාය. රතු රෙදි පටි නළලෙ බැඳගෙන හරි හැඩ කටවියක්. මං හොඳ හැටි ඉවර කරල බැලුවා. අඳුනන ගජයෙක්වත් ඉන්නවද කියල.

ඔය ඔය ඉන්නෙ! දෙයියො දක්ක වගේ රූපෙ.

රූපසිංහ ආ හැටියෙම මාව බදාගත්ත. මිනුව බදාගෙන මුනුණ සිප ගත්තා. "මේ අපේ උන්..." කියල කැගහල කිව්වා. හැමෝම අපි දිහා බලල හිනාවුණා. රතු පාට අකුරින් ලියා ඇති බෝඩ් උලි දෙකක් අපේ අතට ආවා පත වැඩිකරනු, රැකියා කප්පාදුව නවත්වනු, ඈ උස් හඩින් කෑගහල සටන් පාය කියවනවා. හරියට බැංකු ගොඩනැගිල්ලම බිම්බකඩා වැටෙයි වගෙ. මට විශ්ව විද්‍යාල ජීවිතය මතක් වුණා. එහි ගත කරපු කාලය. මිනු ශිෂ්‍ය සංගම් නායිකාවක්. මම වෙනම පිලක. එයට ප්‍රතිවිරුද්ධවයි වැඩ කළේ. මිනුගේ පිලේ එවුන් මගේ ඔළුව පැලුවා. (ඒත් එය අපේ ප්‍රේමයට බාධාවක් වුණේ නෑ) මම ඉස්පිරිතාලෙ ලැග්ග වෙලේ මිනු නිකන්වත්, මාව බලන්න ආවෙද? එහෙම නමයි ත්‍රිල්වාදී දේශපාලනේ හැටි "අයිස් බීම බොමුද? උගුර ගිලෙන්නවගේ..." වර්ජකයින් ගාව කොහින්ද අයිස් බීම. අපි රූපෙගෙන් සහ සගයන්ගෙන් සමුගත්ත. බෙරිහන් දීලම මිනුගෙ මුණ රතුවෙලා "උඹලගෙ සටන කවද හරි ජය ගනිවි" රූපෙ හැක-හැක ගාල බඩ හෙලෙව්ව.

ගෙවිටි වීදිය. ගෙවිටි වීදියට ඇතුළවත්ම කාරුණික ආරාධනා රාශියක්. අපි හිමිකරගන්න සුභද අරගලයක. කොයිතරම් ආදරයක්ද? කරුණාවක්ද? සාප්පුවක් තුළට ඇදුල ගත් අපව පුටු දෙකක වාඩි කෙරෙව්වා. නොයෙකුත් වර්ගයේ ආහරණවලට විදුලි ආලෝකය වැදී දැස් නිලංකාර කරනවා. ගැහුන්ගෙ ආහරණ තමයි ඉතිං වැඩිපුරම. ගැහු කොයිතරම් රත්තරංවලට කැමතිද?

මිනුගෙ වේන් පොට සිත්ත වෙලා දන් හුඟ දවසක් වෙනවා. ඔය දාගෙන ආවෙ 'ඉමිටේෂන්' එකක්. සාප්පුවේ එවුන් හඳනා ගත්තාවත්ද? බස් එකේ එනකොට 'වේන්' එකට අත තියාගෙන ආවෙ. අපේ කරුමෙට කඩාගෙන දුවන එවුන් ඉන්නෙ. ගන්න එක කෙසේ වෙතත්, රත්තරං අතගාන එකත් ගැහුන්ට හරි සැපතක්. හිතපු විදියට අයිස් බීම ආව. අපි තලු මර මර බීව්වා. අපි බොහන කැටි දැකල දුක හිතිලද කොහෙද, තවත් බෝතලයක් ගෙනාවා. මාල වළලු කිපයක්ම දාගෙන මිනු හැඩ බැලුවා. ටික වෙලාවකට හරි ඇත්ත රත්තරං, දාගෙන ඉන්න එක මොන තරම් සතුටක් ද? අභිමානයක්ද? ෂා.. මගේ නෝන හරියට 'නර්ගීස්' වගේ ලස්සනයි. සුන්දරයි. මං මිනුගෙ වමේ ගිහින් හැඩ බැලුව. "ඩයිරෑත් බලාගෙන ඇති..." "අපි හෙට එමු නේද මේව ගන්න" සාප්පු හිමිය රත්තරං බවු ටික ඉක්මණින්ම ගලව ගත්තා. ඔනු මුවෙන් නොබැන බලාසිටිදිදී, අපි එතැනින් පැනගත්තා.

බෝ ගහ යට බස් නැවතුම එකම ගාල ගෝටියක්. කඩිමුඩියේ ගෙදර යන්න පුදුම පොරකෑමක්. හරියට මල්ලව් පොර ක්‍රීඩකයො වගෙ. ගැනු මිනිස්සු පොරකන එකනම් හරිම අපූරුයි. පොරකාලා ඉස්සෙල්ලා බස් එකට නැගගත් එකා විරයෙක් වගේ ආසනයට පස්ස තියා ගන්නවා. 'ජැක්පොට්' ගහල. සිගරට් බිල බස් එකේ යන්න වෙන්නෙ හොරෙන්. ඉඳල හිටලා හොරෙන් යන එකත් ජොලි වැඩක් තමයි. දවල් වේල නම් 'සයිවර්' කඩෙන් විසඳුනා. ඒත් රෑට, රෑ කෑම වේල අල්ලලා යන්න මිනෙ මිස්ට රූපසිංහලාගෙ ගෙදරට. වර්ජනය ගැන විස්තර අහන්නත් ඇහැකි. කෑම මේසෙට එනකම් හෙල්ලෙන්න නරකයි පුටුවලින්. මිනුටත් දන් ඒවගේ ගානක් නැහැ. (අපි හොඳ මධ්‍යම පාංතිකයො තේරුණාද?)

හෝමාගම බස් එක ආවා. සුපුරුදු පුරාකෑම. හොඳ හැටි පොරකන හැටි බලාගෙන අපි ශාන්ත දාන්ත සීත්ත කුවුව වගේ හිටියා. කොන්දොස්තර තැනට නොපෙනෙන්න මං පිටිපස්ස පැත්තෙනුත්, මිනු ඉස්සරහිනුත් නැග ගත්තා. කොහොම වුණත් කොන්දොස්තර තැනට අපි වගේ එවුන් ගැන ඉව තියනවා. මගෙන් ටිකට් ගත්තද අැහැව්වා. මං මිනුව පෙන්නුවා. මිනු ටිකට් ගත් බව අභිඥාක ලෙස සිනහසී හිස සොලවා හැඟෙව්වා. එච්චරයි. බස් එක ටිකෙන් ටික ගමින්ගෙන් පිරුණා. කන්තෝරු ඇරුපු වෙලාවනෙ. කරේ අතේ රුව එන, ගමන් මලුවලින් තවත් ඉඩ ඇහිරෙනවා. තමන් කරන රැකියාවෙ තරම පෙන්වන කරදරකාරී ගමන් මලු. ඒවා ඇතුළෙ මොනව තිබුණත් නැතත් අපිට මොකෝ. දන්නම් හරියට සාධින් වීන් එකක් ඇතුළෙ ඉන්නව වගේ. දාඩිය ගඳ හැමතැනම. උදේ එහෙකොට විහිදෙන විලවුන් සුවඳ හවසට දාඩියත් එක්ක මුසුවෙලා, ඉස්පිරිතාලෙ කානුව වගේ ගඳ ගහනවා. ඊටත් වඩා උඩ අල්ල ගත්තු එවුන්ගෙ කිහිලිවලිනුත්.

රියදුරු තැන සද්ද නගා මගින් දිහා අභිමානයෙන් වගේ බලා "ඔතැනින් ටිකක් පස්සට" වෙන්නැයි තමාගෙ මැදගිල්ලේ රුවා ඇති රත්තරං මුද්දු ජේන විදියට අත දිගු කර ගමින් කිපදෙනෙක් පස්සට යැව්වා. ඕනුව වදිනවත් එක්කම බස් එක ටිකක් ටික ඉදිරියට ඇදුනා. මිනිස්සුන්ගෙන් පිරුණු පදික වේදිකා, උස් දිග ගොඩනැගිලි, වෙළඳ දන්වීම් පුවරු ටිකෙන් ටික පසු වෙලා යනවා. සෝෂාකාරී අගනුවර පරිසරයෙන් මිදින් මඳ අපි සමුගන්නවා. කවුළුවලින් එන මඳ සුළඟින් ගතට මද ප්‍රහෝධයක් දනුණ. 'දමිමිම තහනම්' යැයි ලියා ඇති පුවරුව ළඟම ඉඳන් එකෙක් 'සිගරට්' එකක් උරනවා. මටත් සිගරට්වුවක් මොන්න ආසාවක් ආවා. මිනිසුන් සහජයෙන්ම හරිම අකිකරුයි. එපැයි කියන දේශයි කරන්නෙන. දුම්බිමෙන් මරණයද සිදු විය හැකි යැයි දන්වීම පළකළායින් පස්සෙ, සිගරට් බීමේ සංඛ්‍යාව වැඩි වුණාලු. ජර්මනිය වඩා පුරුද්දු ලොකුයි කීවා. සේ, ඕක අපේ රටේ හැටියක්.

බස් නැවතුමක නැවැත්තු පසු කොන්දොස්තර තැන, ඉස්සරහට යන්නැයි බෙරිහන් දෙනවා. ඉස්සරහට ඇඳුනු කිප දෙනෙක්, ගැහැනු උදවිය ඉන්න අතරින් පතට නැවතුනා. අනුන්ගෙ ගැනු, අනුන්ගෙ මිනිස්සු නොකර සදඳේ කොතරම් සුනද ලෙස ස්පර්ශයේ යෙදෙනවාද? මුහුණ නොබලාම අගපසඟ බස්රිය පැද්දෙන තාලෙට, නටවනවා, නළවනවා. මේකත් අපූරු රති ක්‍රීඩාවක් අපේ බස් සේවයට පිං සිදුවෙන්න.

එකෙක් මිනුව තුරුළු කරගෙන. හරියට ගැනි උගෙ වගේ. මිනුගෙ ඔළුවට නාස් පුඩු දෙක කියා ජීවන සුවඳ විඳිනවා. එයාට හොඳ නම් මට මොකෝ. මං ඉවත බලාගත්තා.

විජේරාම හන්දිය පසු වුණා විතරයි. බස් රිය නැවතුමෙන් තොරව නැවතුනා "වෙසර්ල පැනල" කවුදෝ මගේ කකුට කෙඳිරුවා. මගේ හඳවත සපත්තුවට වැටුනා. මිනු මගේ දිහාවෙ ඔළුව උස්සල බැලුවා. මං දිව එළියට දාල හිනා වුණා. මිනුත් දිව එළියට දම්මා. දොරටු දෙකෙන් නැගිල 'වෙසර්ලා' ටිකට පත් පරීක්ෂා කරන්න පටන් ගත්තා. ඔබිනට නම් දන්ව ජේන්නෙ යම පල්ලොට වගෙ. මුණෙ ලේ කඳුළක්වත් නියෙනවද? උන් ආවම ඇපෙන් නැහැ. දවස රුපියල් පන්සියය ගානට දාගන්න කොහෙන් හොයන්නද? දුන්නෙ නැත්නම බල්ලොට වගෙ කුඩුවට. මිනුගෙ 'ඉමිටේෂන්' චෙන් එකයි වළලු දෙකයි හදිස්සියකටවත්, ලයිසංලෙව්ව්ත් තියන්න පුළුවන්ද? බස් එක මීයට පිම්බා වගේ. 'ටිකට්' ගත්තු අයත් බය වෙලා. අහම්බෙන්වත් ඇංකයක් වැරදිලා නිබ්බොත්. ඒකටත් දඩයක් කන්න වෙනවා. ඒ වගේ අහම්බ දේවල්වලින් මිනිසුන් කොයිතරම් අමාරුවේ වැටෙනවද? ප්‍රශ්න එන කොට කල් තියා දන්වලා එන්නෙ නැහැනෙ.

හිත හිතා ඉන්න වෙලාවක් නැහැ. මං පුරුෂ ශක්තියෙන් පපුව පුරෝන්නාගා. වෙන කෙළ වුණාවෙ. සෙනග පිරාගෙන ගිහිල්ලා ඇඟේ අත තරයේ අල්ලාගත්තා. හරියටම 'වීවස් පීරිස්' එක ඉදිරි පිට බස් නැවතුමෙ බස් එක නවත්තනවාත් එක්කම, ඉදිරි දොර අරක්ගෙන ඉන්න 'වෙසර්ල' කිප දෙනා තල්ලු කරගෙන පැන්න. පැන්න විතරක් නොමෙයි, මිනුගෙ අත තරයේ අල්ලාගෙන, හයිලෙවල් පාරෙ එහා පැත්තෙ තියෙන කුඹුර පැත්තට වේගයෙන් දුවන්න පටන් ගත්තා. අනුනාවයෙන් බේරුණෙ. කාර් කාරයක් අපිට බැන බැන ගියා. තව පොඩිවෙන් දඩයක් නෙමෙයි අඩයක් වෙන්නයි තිබුණ.

කම්බි වැටෙන් රිංගලා මිනුගෙ ගවුමත් ගුලිකා. නියර දිගේ මං ඇ පිටිපස්සෙන් හති නොහැරම දිව්වා. මිනුගේ එක සෙරප්පුවක් කකුළක තිබුණේ නැහැ. සෙරප්පුව මගේද දඩය. මිනු ආපසු හැරිලා හිනා වෙලා අත වැනුවා. මං ආපහු හැරුනා. 'වීවස් පීරිස්' ලොකු තාප්පය අසල බස් රිය නතර කරලා, සමහර ශබ්දවලින් බෙලි එළියට දාගෙන අපි දිහාවෙ බලා ඉන්නවා. අපි ඔවුන්ට අත වනන්න පටන් ගත්තා. කිප දෙනෙක් අපිටත් අත වැනුවා. අපි අත වනමින්ම නියර දිගේ හිමිව ඉදිරියට ඇඳුනා.

මං මිනුගෙ ගිනි බණ්ඩාර සඳ එළියෙන් ආපු ආදරණීය සරණ පාල කුමාරයා එදා වගේම.